**පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශීය සභාව**
**මුලතිව් දිස්ත්‍රික්කය**
-----------------------------

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 13 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ඔක්තෝබර් 05 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ)** **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඒවා විගණනයට ඉදිරිපත් කිරිමේදී අනුගමනය කළ යුතුව තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුය. | ඉදිරි කාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව පිළියෙල කිරිමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ආ)** **ප්‍රමාණාත්මක ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කාර්යාල උපකරණ 37ක වටිනාකම එකතුව රු.1,075,195ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල පිරියත හා යන්ත්‍රෝපකරණ ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල පිරියත හා යන්ත්‍රෝපකරණ | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | එකතුව රු.1,075,195.00ක් වූ වර්ග 37ක කාර්යාල උපකරණ, පිරියත හා යන්ත්‍රෝපකරණවල ඇතුළත් කිරිම හේතුවෙන් සිදුකළ යුතු නිවැරදි කිරිම් 2020 වර්ෂය සඳහා වූ මූල්‍ය |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම රු.1,075,195කින් වැඩියෙන් සහ කාර්යාල උපකරණ වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | ප්‍රකාශන පිළියෙල කිරිමේදි නිවැරදි කරනු ලැබේ. |
| (ii) | එකතුව රු.2,178,060ක් වූ පරිගනක හා උපාංග 29ක වටිනාකම සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල පිරියත හා යන්ත්‍රෝපකරණ ලෙස දැක්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පිරියත හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු. 2,178,060කින් වැඩියෙන් හා පරිගනක හා උපාංගවල වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල නිසි අයුරින් දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | එකතුව රු. 2,178,060.00ක් වූ පරිගනක හා උපාංග 29ක වටිනාකම, 2020 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි පරිගනක හා උපාංග ශීර්ෂය යටතේ ඇතුළත් කරනු ලබන බව දන්වා සිටිමි. |
| (iii) | කාර්යාල උපකරණ 19ක වටිනාකම එකතුව රු.578,892ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවිකිරීම් ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවි කිරීම් වටිනාකම රු. 578,892කින් වැඩියෙන් සහ කාර්යාල උපකරණ වටිනාකම එම අගයෙන් අඩුවෙනුත් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල නිසි අයුරින් දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | එකතුව රු. 578,892ක් වූ වර්ග 19ක කාර්යාල උපකරණ, ලීබඩු හා සවි කිරීම්වල ඇතුළත් කිරීම හේතුවෙන් සිදුකළ යුතු නිවැරදි කිරීම් 2020 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි නිවැරදි කරනු ලැබේ. |
| (iv) | සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ කාර්යාල හා ක්ෂේත්‍ර උපකරණ වටිනාකම් එකතුව හා ශේෂයන්ගේ එකතුව අතර රු.75,100ක වෙනසක් නිරීක්ෂණය විය. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල නිසි අයුරින් දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ කාර්යාල හා ක්ෂේත්‍ර උපකරණ වටිනාකම් එකතුව රු.75,100ක් අඩුවෙන් දැක්වීම හේතුවෙන් සිදුවූ දෝෂ 2020 වර්ෂය සඳහා වූ අවසන් ගිණුම් පිළියෙල කිරිමේදි නිවැරදි කරනු ලැබේ. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම්, ගොඩනැගිලි, ළිං, ණයගැතියන් සහ වියදම් ණයහිමියන් ගිණුම් ශේෂවලට අදාල එකතුව රු. මිලියන 69.29ක් සඳහා ඉඩම් හිමිකම් ඔප්පු, මිනින්දෝරු ප්ලෑන සහ වටිනාකම් තක්සේරු සහතික, ඓතිහාසික පිරිවැය පත්‍රිකා, කර්මාන්ත ලිපිගොනු සහ ශේෂ සනාථ කිරීම් ආදිය විගණනයට නොලැබීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පිළිගෙන සනාථ කළ නොහැකි විය. | අනාවරණය කර ඇති ලිඛිත ලේඛන ලබාගැනීමෙන් පසුව නියමිත පරිදි ගොනුගත කිරීමට සභාව විසින් උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. | ඵලදායි කළමනාකරණ මෙහෙයුම් සිදුකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි. ඉදිරි කාලයෙදි විගණනයට අවශ්‍ය සියළුම ලියවිලි ඔබ වෙත ඉදිරිපත් කරනු ලබන බවත් දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | III පරිච්ඡේදයේ රීති 33 | වරිපනම් බදු සම්බන්ධයෙන් තක්සේරු කිරීම් සිදුකිරිමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු තක්සේරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් නියමිත කාල වකවානුවලදි සිදුකළ යුතු වේ. | දේපල සඳහා වටිනාකම තක්සේරු ක්‍රියාවලිය අවසන් වූ පසුව බදු අයකිරීමේ ඉදිරි කටයුතු සිදු කෙරේ. |
| (ii) | V පරිච්ඡේදයේ රීති 140 | විවිධ සේවා සමූපකාර සමිතියකට ගෙවා තිබූ අත්තිකාරම් 06 කින් එකතුව රු.274,367 ක් පසුගිය වර්ෂ 09 ක සිට නිරවුල් නොකර තිබූ බව නිරීක්ෂණය විය. ඒවා මේ දක්වා ගැලපීමට සභාව අපොහොසත් වි තිබුණි. | කොන්ත්‍රාත් කාර්යයන් අවසන් නොවූ අවස්ථාවකදි කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් ගෙවීමෙන් වැලැකි සිටිය යුතු වේ. | සියළුම අත්තිකාරම් 2019 වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 155 | විගණන විමසුම්වලට පිළිතුරු කඩිනමින් ලබා දීමට කටයුතු නොකර මාස 01 සිට මාස 03ක් දක්වා කාල ප්‍රමාදයක් සිදුකර තිබුණු අවස්ථා 09ක් නිරීක්ෂණය විය | විගණන විමසුම් සඳහා පැහැදිලි කිරීම් අවහා ආකාරයෙන් කඩිනමින් යැවීමට උචිත ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | ඉදිරි කාලයේදි ඔබගේ විගණන විමසුම්වලට ඔබගේ විමසුම්වලට පිළිතුරු කඩිනමින් යැවීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ ලංසු ඇප තැන්පතු 36ක්, ඇප මුදල් තැන්පතු 40ක් සහ විවිධ තැන්පතු 35ක එකතුව රු.6,903,703 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, වර්ෂ 01 | නියමිත කාලයේදි සුදුසු ක්‍රියාමාර්ගයන් සභාව විසින් ගත යුතු වේ. | කඩිනමින් ආපසු ගෙවීමට කටයුතු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | සිට 07ක් දක්වා කාලයක් තැන්පතු ගිණුම්වල රඳවා ගෙන තිබුණි. | | |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාවේ වාහන 14කට වර්ෂ දෙකක සිට ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | වාහන සඳහා ඉන්ධන පරිභෝජන පරීක්ෂාවන් නියමිත කාල වකවානු තුළදී සිදුකිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | අදියරෙන් අදියර ඉන්ධන පරිභෝජන පරීක්ෂාවන් සිදු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

## 2 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 50,893,639ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 40,570,244 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 202,000 | 2,400 | 2,400 | - | 216,000 | 223,700 | 223,700 | – |
| (ii) | කුලී | 18,104,000 | 18,238,703 | 17,158,514 | 1,080,189 | 17,349,000 | 17,788,141 | 17,337,131 | 615,797 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,186,000 | 10,138,634 | 10,138,634 | – | 12,530,000 | 6,805,052 | 6,805,052 | – |
| (iv) | වෙනත් ආදායම් | 29,322,000 | 42,787,767 | 17,574,962 | 44,015,767 | 17,444,000 | 32,726,896 | 10,591,236 | 38,152,548 |
| | එකතුව | **51,814,000** | **71,167,504** | **44,874,510** | **45,095,956** | **47,539,000** | **57,543,789** | **34,957,119** | **38,768,345** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------

අයවැය ඇස්තමේන්තු නිවැරදි ආකාරයෙන් පිළියෙල නොකිරීමත් ඇස්තමේන්තු නිවැරදිව පුරෝකථනය නොකිරීමත් නිසා ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර විචලනයන් පැවතුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පුදුකුඩිඉරුප්පු පොදු වෙළෙඳපොලේ කඩකාමර 05ක් සහ විසුවාමඩු පොදු වෙළෙඳපොලේ කඩකාමර 03ක් වශයෙන් කඩකාමර 08ක් 2018 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා වසාදමා තිබුණි. මේ සම්බන්ධයෙන් සභාවේ 2018 අප්‍රේල් 12 දිනැති අංක 56 දරන තීරණ සහ 2018 මැයි 03 දිනැති අංක 76 දරන තීරණය අනුව කඩකාමර කුලී පදනමින් මින්පසුව ලබානොදෙන බවට තීරණය කර තිබුණි. මේ හේතුවෙන් එකතුව රු.228,000ක ආදායමක් සභාවට අහිමි වී තිබු බව නිරීක්ෂණය විය. | නියමිත කාල වකවානු තුළ මෙවැනි දේපල ලංසු කැඳවීමේ ක්‍රියාවලියට භාජනය කිරීමත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් ක්‍රියාත්මක කර එයින් ආදායම් නියමිත කාලයේදී අයකිරිමටත් ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | පුදුකුඩිඉරුප්පු පොදු වෙළෙඳපොලේ පිහිටි කඩකාමර 05ක් සභාවේ තීරණ අනුව නව ප්‍රතිලාභීන් තොරා ගැනීමෙන් ලබාදී ඇති අතර විසුවාමඩු පොදු වෙළෙඳපොලේ කඩකාමර 03න් එක් කඩකාමරයක් මෙයට පෙර ගිවිසුම් අත්සන් කළ පුද්ගලයාටම නැවත භාරදී තිබුණි. ඉතිරි කඩකාමර දෙකම ආපසු ලබා නව ප්‍රතිලාභීන්ට ලබාදීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ii) | පුදුකුඩිඉරුප්පු, විසුවාමඩු සහ උඩෙයාර්කට්ටු කඩකාමර පේලියේ ක්‍රියාත්මකව පවතින කෑම කඩකාමර 05ක් වර්ෂ තුනකට අධික කාලයක සිට ව්‍යාපාර බලපත්‍ර ලබාගැනීමට නුසුදුසු තත්ත්වයේ පැවැතියදී සභාව විසින් තාවකාලික ව්‍යාපාරික බලපත්‍ර නිකුත් කිරීමෙන් පසුව ව්‍යාපාර කටයුතු කරගෙන ගොස් තිබූ බව නිරික්ෂණය විය. | නියමිත කාල වකවානු තුළ මෙවැනි දේපල ලංසු කැඳවීමේ ක්‍රියාවලියට භාජනය කිරීමත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් ක්‍රියාත්මක කර එයින් ආදායම් නියමිත කාලයේදී අයකිරිමටත් ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | අදාල කඩකාමරවල ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් තාවකාලික වෙළෙඳ බලපත්‍ර ලබාදීමෙන් කඩකාමර කුලී අයකරමින් පැවතුණි. සභාව විසින් ස්ථිර කඩකාමර ඉදිකිරීමෙන් පසුව වෙළෙඳ බලපත්‍ර නිකුත් කරනු ලැබේ. |

## 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ණය ගිණුමේ දක්වා ඇති හිඟ කුලී සහ බදු එකතුව රු.1,080,189ක් අය කිරීම සඳහා පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 03 ක කාලයක සිට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | එවැනි ආදායම් හා එටය සම්බන්ධිත හිඟ මුදල් අයකර ගැනීම සඳහා සභාවේ ලේකම්වරයා විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | රු.1,080,189.00කින් රු.396,581ක් රැස්කර ඇත. ඉතිරි මුදල් කඩිනමින් අයකිරිමට කටයුතු කරන්නෙමු. |

### 2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ සමාලෝචිත වර්ෂයේ ඔලුමඩු සහ පුදුකුඩිඉරිප්පු උප කාර්යාලවලට අයත් බල ප්‍රදේශවල ක්‍රියාත්මක වන ව්‍යාපාරික ස්ථාන 411 ක් ස්ථිර ව්‍යාපාර බලපත්‍ර ලබානොගෙන තාවකාලික බලපත්‍ර මත ව්‍යාපාර කටයුතු කරමින් තිබුණි. සභාව විසින් ස්ථිර ව්‍යාපාර බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් පසුගිය වර්ෂ දෙකෙහිදි සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ව්‍යාපාර බලපත්‍ර සහ ව්‍යාපාර බදු සහතික අයකර ගැනිමට සුදුසු පියවර නියමිත කාලයේදි ගත යුතු වේ. | මෙම වර්ෂයේ සිට ස්ථාර ව්‍යාපාර බලපත්‍ර නිකුත් කරමින් පවති. ඉදිරියේදි ස්ථිර ව්‍යාපාර බලපත්‍ර පමණක් නිකුත් කිරිමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.5 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.40,152,657ක් උසාවි දඩ සහ රු.3,863,110ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයවිය යුතු මුදල් නියමිත කාලය තුළ ලබාගැනීම සඳහා ප්‍රයෝජනවත් අයුරින් සභාව විසින් අදාල කාලයේදි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | උසාවි දඩ මුදල් රු.40,152,657කින් රු.38,183,739ක් දැනට ලැබී ඇත. හිඟ ආදායම් ලබාගැනීම සඳහා පළාත් භාණ්ඩාගාරයට ඉල්ලීම් කිරිමේ ලිපිඅප විසින් යවනු ලැබ ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් සහ ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ කාල ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සභාවේ අරමුදල් සහ පළාත් සභාවට වෙන් කරන ලද සංවර්ධන ආධාර අරමුදල් මගින් අවසන් කළ යුතුව තිබූ එකතුව | එවැනි ව්‍යාපෘති නියමිත කාල වකවානු තුළ සම්පූර්ණ කර ගැනීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ ලබාදුන් මාර්ග ව්‍යාපෘති කාර්යයන් සඳහා අමුද්‍රව්‍ය ලබාගැනීමේදි සිදුවූ ගැටළු (බොරළු) සහ ස්වාභාවික කාලගුණික |

| | | |
|---|---|---|
| රු. මිලියන 14.16ක් වටිනා මාර්ග ප්‍රතිසංස්කරණ 06ක් සහ පුනරුත්ථාපන කාර්යයන් 06ක් කොන්ත්‍රාත්කරුවන් විසින් පසුගිය මාස 07ක සිට මාස 10ක් දක්වා කාලයක් සම්පූර්ණ කර නොතිබුණි. | | විපර්යාසයන් හේතුවෙන් (වැස්ස) නියමිත කාර්යයන් අදාල කාල පරාසය තුළ ඉටු කළ නොහැකිව පැවතුණි. එනමුත්, වර්තමානයේ අදාල කර්‍මාන්තයන් අවසන් කර ඇත. |

**(ආ) අපේක්ෂිත නිමැවුම් ළඟා කරගැනීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසයේ පළාත් සභාවට වෙන් කරන ලද සංවර්ධන ආධාර අරමුදල් මගින් එකතුව රු. මිලියන 2.11ක සන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය සඳහා ඉදිකරනු ලැබූ ගොඩනැගිල්ලෙන් අපේක්ෂිත නිමැවුම් මට්ටම ළඟා කරගැනීමට නොහැකිව මේ දක්වා නිෂ්කාර්යව පැවතුණි. | එම ව්‍යාපෘති වෙනුවෙන් ආයෝජනය කළ අරමුදල්වලට අදාල නිමැවුම් මට්ටම ලබාගැනීමට උචිත ක්‍රියාමාර්ගයන් සභාව විසින් කඩිනමින් ගත යුතුවේ. | වෙනත් ව්‍යාපෘති මාර්ගයෙන් නියමිත කර්‍මාන්තය ඉදිරියට ගෙන යාම සඳහා කටයුතු කරමින් පවති. කාර්යයන් අවසන් වූ විගස සන අපද්‍රව්‍ය වෙන් කර ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියට භාජනය කිරිම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ බැහැර කරනු ලබන කැලිකසළ, ගිනිතැබීම හා වලදැමීම යන කාර්යයන් පමණක් සභාව විසින් සිදු කරන අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ වැනි සන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට සභාව විසින් පසුගිය වර්ෂ 05ක් තිස්සේ ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිවලින් සමන්විත සන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | සන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය සඳහා වූ 2019 වර්ෂයේ Compost Yard ස්ථාපිත කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවති. එසේම, කසළ වෙන්කර රැස්කිරිම සඳහා විවිධ පාටවලින් යුත් කසළ බඳුන් මිලදී ගෙන පොදු ස්ථානවල තබා ඇත. |

**(ඈ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2030 වර්ෂයේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම | තිරසාර සංවර්ධන ඉලක්ක ස්ථාපිත කර එහි | ව්‍යාපෘති යෝජනා කර උතුරු පළාත් පළාත්පාලන |

| | | |
|---|---|---|
| සඳහා සභාව විසින් ළඟා කර ගත යුතු ඉලක්ක සහ එම ඉලක්ක ළඟාකර ගැනීමේදි පවතින බාධක මෙන්ම ප්‍රගතිය මැනීම සඳහා සුදුසු දර්ශකයන්ද 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව පසුගිය දෙවර්ෂයේදි ස්ථාපිත කිරිමට සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාර්ෂික ප්‍රගතිය දැනගැනීම සඳහා දර්ශක ස්ථාපිත කිරිමට ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගතයුතු වේ. | කොමසාරිස්වරයාට අනුමැතිය සඳහා යවා ඇත. අනුමැතිය ලැබූ වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සහ ඊට අනුරූපී වර්ෂයේ සභාවේ වාර්ෂික අයවැය සැලැස්මේ එකතුව රු. මිලියන 83.17 ක පිරිවැයකට ඇස්තමේන්තු කර අනුමත කරන ලද මූලධන ව්‍යාපෘති 13 ක් ඉඩම් ගැටළු, විවිධ දුෂ්කරතාවයන් පැවතීම, අශක්‍යවීම, මධ්‍යම සහ පළාත් පාලන අමාත්‍යාංශවල වෙනස්වූ ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම වැනි හේතුන් නිසා නියමිත කාලයේදි ක්‍රියාත්මක කිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග නොගෙන ප්‍රමාදයන් සිදුකිරීමෙන් සභාවේ අයවැය යෝජනාවන් දුර්වලවී තිබුණි. | සභාව විසින් අදාල වර්ෂයේදි සහ අරමුදලින් ක්‍රියාත්මක කර ඉටුකළ යුතුව පැවැති ව්‍යාපෘතින් පමණක් සභාව විසින් අයවැය සැලැස්මේ ඇතුළත් කර ක්‍රියාත්මක කිරිමේ කටයුතු සිදුකළ යුතු වේ. | මෙම අඩුපාඩු යථාතත්ත්වයට පත්කර අදාල වර්ෂයේදීම කාර්යයන් අවසන් කිරිමට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක පුරප්පාඩු සහ අතිරික්තයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් තාක්ෂණික නිලධාරින් දෙදෙනෙකු, වෙළෙඳපොල සුපරීක්ෂකවරු, සෞඛ්‍ය පරීක්ෂකවරු සහ වැඩ කම්කරුවන් පස්දෙනෙකුගේ සේවක පුරප්පාඩු පසුගිය වර්ෂ 05ක කාලයේදි පුරවා නොමැති විමෙන් ඔවුන් විසින් ඉටු කළයුතුව තිබූ සභාවේ රාජකාරි ප්‍රමාදවීම් සහ දුර්වලවීම් නිරීක්ෂණය විය. එසේම, අනුමත කළ කාර්යමණ්ඩලයට අමතරව සභාව විසින් වාහන රියැදුරෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඔහුට පසුගිය දෙවර්ෂයේදි සභාවේ අරමුදලින් වැටුප්ද ගෙවා තිබුණි. | කාර්යමණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ අයුරින් ප්‍රසිද්ධ කිරිම මගින් නියමිත කාලයේදි ලබා ගැනීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සෞඛ්‍ය කම්කරු, වැඩ කම්කරු, මුරකරු සහ රියැදුරු වැනි තනතුරු සඳහා අයැදුම්පත් කැඳවා ඇත. එසේ වුවත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මේ දක්වා නොලැබීම හේතුවෙන් ස්ථිර පත්වීම් ලබාදිය නොහැකි වී තිබුණි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නඩත්තුව හා අලුත්වැඩියාවන් සිදු කිරීමට අපොහොසත්වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට පරිත්‍යාග කර තිබූ වතුර මෝටරය සහ අත්ට්‍රැක්ටරය පසුගිය වර්ෂ 10කදි අලුත්වැඩියා කර භාවිතා කළ හැකි තත්ත්වයට පත්කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කළයුතු වාහන සම්බන්ධයෙන් ඵලදායී ක්‍රියාමාර්ග සභාව විසින් ගතයුතු වේ. | අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පැවැති වතුර මෝටරය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් පොදු 47 ආකෘති පත්‍රිකාවේ ඇතුළත් කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු කර ඇත. සභාවට පරිත්‍යාග කර තිබූ වාහනවලින් අත් ට්‍රැක්ටරය සභාවට භාරදුන් බවට වූ සාක්ෂි කිසිවක් සභාව සතුව නොමැත. එසේම, එහි අයිතිය තහවුරු කළ හැකි ලේඛන, ලියාපදිංචි පොත් නොමැතිවීමෙන් අදාල වාහනය අලුත්වැඩියා කර භාවිතා කිරිමට හෝ විකිණීමට නොහැකිව ඇත. එසේම, මෙය අලුත්වැඩියා කර භාවිතා කිරිමට සුදුසු ට්‍රේලරයක්ද නොමැත. එමෙන්ම, සභාවේ ට්‍රැක්ටර් 06ක භාවිතයේ පවතින බැවින් අත්ට්‍රැක්ටරය සභාවේ භාවිතයට ඵලදායි එකක් වනු ඇතැයි අපේක්ෂා කළ නොහැකි විය. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජය සහ රජයේ නොවන ආයතන විසින් ලබා දී සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 21ක් වෙනුවෙන් වාහන ලියාපදිංචි කිරීමේ පොත් ලබාගැනීමට පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 10ක් දක්වා කාලයක් සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | සභාව විසින් භාවිතා කරනු ලබන වාහන වෙනුවෙන් ලියාපදිංචි කිරීමේ පොත් ලබාගැනීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. | ලියාපදිංචි කිරීමේ පොත් නොමැති අනෙකුත් වාහනවල අයිතිකරුවන් පිළිබඳ තොරතුරු ලබාගෙන පියවරෙන් පියවර ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

### 3.4.3 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 අනුව සිදු කළ යුතු පසු විපරම් ක්‍රියාමාර්ග සභාව විසින් සිදුකර නොතිබුණි. | පසු විපරම් ක්‍රියාමාර්ග අදාළ කාලපරිච්ඡේදය තුළ සිදුකර අවසන් කිරීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. | මෙම කටයුතු අවසන් වූ වහාම වාර්තාව ඔබ වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. |

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂවල සභාවට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කර නොතිබුණි. | වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන නියමිත කාලය තුළ පිළියෙල කිරිමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයට පෙර ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන පිළියෙල කර නොතිබුණි. නමුත් 2020 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර ක්‍රියාත්මකව පවති. |

### 3.5.2 භාණ්ඩ හා සේවාවන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන පරිපූරක මිලදී ගැනීමේ ක්‍රමයට සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය රහිතව එකතුව රු.1,620,740කට ලිපිද්‍රව්‍ය, විදුලි උපකරණ, වාහන අලුත්වැඩියා, ටෝනර් සහ දෛනිකව භාවිතා කරන ද්‍රව්‍ය විවිධ සැපයුම්කරුවන්ගෙන් සෘජුව මිලදී ගෙන තිබූ අවස්ථා 12ක් නිරීක්ෂණය විය. | සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගැනීමෙන් භාණ්ඩ හා සේවාවන් ලබාගැනිමට කටයුතු සභාව විසින් ගතයුතු වේ. | ඉදිරි කාලයේදි මෙවැනි දෝෂ සිදු නොවන පරිදි කටයුතු කරනු ලැබේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා අයවැය සැලැස්ම නිවැරදි පුරෝකතනයන් අනුව සැලසුම් කර පිළියෙල නොකිරීම නිසා වර්ග 04ක ඇස්තමේන්තුගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 06 ක සියයට 07 ක් දක්වා පරාසයක යහපත් විචලනයන් ද සියයට 10 ක සියයට 47 ක් දක්වා පරාසයක අයහපත් විචලනයන් ද වර්ග 03ක ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර පිළිවෙලින් සියයට 60 සිට සියයට 142 දක්වා යහපත් විචලනයන් ද නිරීක්ෂණය විය. | සභාව විසින් උචිත කරුණු සැලැකිල්ලට ගෙන ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි වාර්ෂික අයවැය සැලැස්මක් සකස් කර කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරිමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ඉදිරි කාලයේදී ඔබගේ අදහස් පිළිබඳ අවධානය යොමුකර අයවැය සැකසීමට කටයුතු කරනු ලබන බවට දන්වා සිටිමි. |